## ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය - 2017 වර්ෂය

---------------------------------------------------------

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විධායක සභාවේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම විධායක සභාවේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සම්මේලනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය වෙත ක්‍රීඩා තරඟ වලට අදාළ විදේශ සංචාරයන් සඳහා රු.6,260,000 ක් පිරිවැය වූ ගුවන් ටිකට්පත් ලබා දී තිබුණද එම වටිනාකම සම්මේලනයේ ආදායම් හා වියදම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ඉරාන අත්පන්දු සම්මේලනයේ ඉල්ලීම මත 2008 වර්ෂයේ 7 වන ආසියානු තරුණ අත්පන්දු තරඟාවලිය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ආධාර ඇතිව ඉස්ලාමික් රිපබ්ලික් ඉරාන ගුවන් විදුලිය (නෙට්වර්ක් - 3) ඔස්සේ විකාශනය සිදු කිරීම වෙනුවෙන් ඉරාන අත්පන්දු සම්මේලනයෙන් ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය වෙත ලැබිය යුතු රු.2,300,000 ක් සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය සහ පෞද්ගලික ණය හිමියන් 09 දෙනෙකු වෙත ගෙවිය යුතු එකතුව රු.8,770,969 ක් වර්ෂ 04 ක සිට හා රු.25,000 ක් වූ උපචිත වියදම් ශේෂ 02 ක් වර්ෂ 02 ක සිට නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ආ) 2016 වර්ෂයේ තායිලන්තයේ පැවති සාර්ක් තරඟාවලියේ පුහුණුවීම් කටයුතු සඳහා තරඟ සංවිධානය කරන පෞද්ගලික ආයතනයක් වෙත ලබා දුන් අත්තිකාරම් මුදලින් නොපියවූ ශේෂය වූ රු. 43,050 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) 14 වන ආසියානු කනිෂ්ඨ වොලිබෝල් තරඟාවලිය සඳහා 2014 වර්ෂයේ සිට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබූ රු.1,595,460 ක් සමාලෝචිත වර්ෂය දක්වා ලබා ගෙන නොතිබුණි. මෙම ණය පිළිබඳව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුම්වල කිසිදු සටහනක් නොමැති බවද වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

**2.2.3 විගණනයට සාක්ෂි නොමැති වීම**

පළාත් වොලිබෝල් ක්‍රීඩා තරඟ කටයුතුවල වියදම් පියවා ගැනීම සඳහා සම්මේලනයේ ක්‍රීඩා සම්බන්ධීකරණ නිලධාරීන් 15 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු. 2,224,920 ක් සඳහා වියදම් විස්තර ඇතුළත් අනුමත ඇස්තමේන්තු හා බිල්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්මේලනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.590,121 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,715,285 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,305,406 ක පිරිහීමක් පෙන්නුම්කර තිබුණි. ආදායම රු.6,574,840 කින් අඩු වී තිබීම සහ සෘජු වියදම් රු.2,214,613 කින් වැඩි වී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේද අයවැය ලේඛනය පිළියෙල කර නොමැති බව දක්වා ඇතත් 2017 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සම්මේලනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය පාලනය | සම්මේලනයේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි අයවැය පාලනයක් ස්ථාපිත කර නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් විදේශ සංචාරයක් සඳහා ලද ගුවන් ටිකට්පත් වටිනාකම ගිණුම්ගත කර නොතිබීම. |